අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/05/02/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2019.04. 24

චක්‍රලේඛ අංක:-25/2019

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල් ප්‍රධානීන් වෙත

## පාසල් පරිශ්‍රය තුළ ආරක්ෂාව තහවුරු කිරීම.

රටක අනාගතය සම්බන්ධ ප්‍රධාන තීරණාත්මක සාධකය වන මානව සම්පත සංවර්ධනය කෙරෙන ප්‍රධාන කේන්ද්‍රස්ථානය පාසල යි. ඒ අනුව, සමාජ සංස්ථාවක් ලෙසින් පාසලට පැවරෙන ප්‍රමුඛ කර්තව්‍යයක් වනුයේ ශිෂ්‍ය ප්‍රජාවට සුරක්ෂිත වාතාවරණයක් පාසල තුළ ස්ථාපිත කරමින් පූර්ණ පෞරුෂයකින් යුත් යහපත් පුද්ගලයන් ලෙස සමාජගත වීමට අවස්ථා සැලසීම ය.

පාසල් සිසුන් තම දෛනික සක්‍රිය කාල සීමාවෙන් සැළකිය යුතු කාලයක් පාසල තුළ ගත කරනු ලැබේ. එබැවින්, සිසුන් පාසලට අවතීර්ණ වීමත් සමඟ ම සෑම සිසුවෙකුගේ ම භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධ පූර්ණ වගකීම විදුහල්පති හා සෙසු කාර්ය මණ්ඩලය වෙත පැවරේ. එය තම රාජකාරියෙහි ම කොටසක් වන අතර සමස්ත කාර්ය මණ්ඩලයේ ම වගකීමක් මෙන් ම යුතුකමක් ද වේ.

චක්‍රලේඛ අංක **2011/17** අනුව ළමා අපයෝජන වළක්වා ගනිමින් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා දැනට පාසල්වල " පාසල් ළමා ආරක්ෂක කමිටු - සුරකුම් පවුර " වැඩපිළිවෙල ක්‍රියාත්මක වුව ද වර්තමානයේ රටේ පවතින ආරක්ෂක තත්ත්වය හේතු කොට ගෙන පාසල් සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධ ව කටයුතු කිරීමට විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව, මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

### 1.0 පාසල් ප්‍රජාව දැනුවත් කිරීම

සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ සුරක්ෂිතතාව, අනතුරු අවස්ථාවක දී කටයුතු කළ යුතු ආකාරය, අනතුරු හා අවදානම් තත්ත්ව හඳුනාගැනීම හා වළක්වා ගැනීම ආදිය සම්බන්ධයෙන් අවධානය යොමු කර පාසලේ ආරක්ෂක වැඩපිළිවෙලක් සකස් කර ඒ පිළිබඳ ව පාසලේ සියලු ම කාර්ය මණ්ඩලය, සිසුන්, දෙමාපියන් හා ආදි සිසුන් දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතු ය.

## 2.0 ආරක්ෂක කමිටු පිහිටුවීම

පාසල තුළ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ආරක්ෂක කමිටුවක් හා අනුඅකමිටු කිහිපයක් විදුහල්පති නියෝජ්‍ය විදුහල්පති ඇතුළු ව ආචාර්යය මණ්ඩලය, දෙමාපියන්, ආදිශිෂ්‍ය සමිති නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පිහිටුවා ගත යුතු ය. මෙම කමිටුවල සාමාජික සංඛ්‍යාව පාසල් කළමනාකරණ කමිටුව විසින් තීරණය කළ යුතු අතර අවශ්‍යතාවය පරිදි රැස්වීම් පවත්වා වාර්තා තබා ගත යුතු ය.

## 3.0 ආරක්ෂාව සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු වැඩපිළිවෙල

ඉහත කමිටුව මඟින් විද්‍යාලයේ ආරක්ෂාව පිළිබඳ ව වැඩපිළිවෙලක් සකස් කළ යුතු අතර පහත සඳහන් මූලික කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන ලෙස ද දන්වමි. මේ සම්බන්ධයෙන් ප්‍රදේශයේ, ආසන්න පොලිස් ස්ථානය මඟින් විශේෂ ආරක්ෂක කමිටු පිහිටුවා ඇත්නම් එහි සහයෝගය ද ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

3.1 පාසල හා පාසල අවට පරිශ්‍රය පරීක්ෂා කර අවදානම් තත්ත්වයක් නොමැති බවට තහවුරු කරගත යුතු ය. ඒ සඳහා, ඉහත කමිටු හා අදාළ පාර්ශ්ව වෙත නිසි පරිදි වගකීම පවරා ලිඛිත ව වාර්තා කර ගැනීමට ක්‍රමවේදයක් අනුගමනය කර පාසලේ විදුහල්පති/නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙකු මඟින් සුපරීක්ෂණය කළ යුතු ය.

3.2 පාසලට සිසුන් පැමිණීමේ දී පාසලේ ප්‍රධාන හා අනෙකුත් පිවිසුම් දොරටු ආශ්‍රිත ව මාර්ග තදබදය අවම කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතු ය. මෙහි දී පාසල් ප්‍රවාහන සේවා ක්‍රියාත්මක වන්නේ නම් රථ ගාල් කරනු ලබන ස්ථාන හා වේලාව පිළිබඳ ව අදාළ රියදුරු මහත්වරුන් දැනුවත් කර උචිත වැඩපිළිවෙලක් අනුගමනය කිරීම කළ යුතු ය.

3.3 පාසලට පිවිසෙන්නන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම මෙන් ම ගමන් මලු, පාසල් බෑග් හා අනෙකුත් ද්‍රව්‍ය පරීක්ෂා කිරීමෙන් අනතුරු ව පාසල් පරිශ්‍රයට රැගෙන ඒමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය.

3.4 ශ්‍රේණි ප්‍රධාන හා පන්තිභාර ගුරුභවතුන්ගේ අධීක්ෂණය යටතේ පන්ති කාමර තුළ ආරක්ෂාව තහවුරු කර ගැනීම කළ යුතු ය.

3.5 අනවශ්‍ය පරිදි සිසුන් පන්ති කාමරයෙන් බැහැර වීම, පාසල් පරිශ්‍රය තුළ නිකරුණේ ගැවසීම ආදිය වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අතර නේවාසිකාගාර සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතු ය.

3.6 පාසල් සිසුන් ඒකරාශී කර පාසලේ ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් හා සිසුන් පාසලෙන් පරිබාහිර ව පැවැත්වෙන වැඩසටහන් සඳහා සහභාගී කර වීම ආදිය අවම කිරීම හා එවැනි අවස්ථාවල සිසුන්ගේ උපරිම ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කිරීම.

3.7 පාසලේ විවේක කාලයේ දී හා පාසල තුළ සිසුන් ඒකරාශී වන උදෑසන රැස්වීම වැනි අවස්ථාවල ගුරුවරුන්ගේ, ශිෂ්‍ය නායකයන්ගේ මූලිකත්වයෙන් සුපරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

3.8 පාසල තුළ නිරන්තරයෙන් දෛනික ව භාවිතා නොකරන ශ්‍රවනාගාර, ක්‍රීඩාගාර හෝ වෙනත් ගොඩනැඟිලිවල සිසුන් ගැවසීම අවම කිරීම හා ආරක්ෂිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

3.9 මහජන දිනයේ දී විදුහල්පති හමුවීම, සහතික නිකුත් කිරීම වැනි කාර්යයන් සඳහා පාසල් පරිශ්‍රයට පිවිසීමට අවසර ලබාදීමේ දී සැළකිලිමත් විය යුතු ය.

3.10 හදිසි අවස්ථාවක දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ව සිසුන් හා පාසලේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන සන්නිවේදන ක්‍රමවේදයක් අනුගමනය කිරීම.

3.11 සිසුන් පාසලෙන් බැහැරවීමේ දී අනවශ්‍ය තදබදයක් ඇතිවීම වළක්වා ගැනීමට ක්‍රමවේද අනුගමනය කිරීම. මේ සඳහා අදාළ ප්‍රවාහන සේවා සපයන ආයතන සමඟ සාකච්ඡා කර සුදුසු

3.12 ක්‍රීඩා හා වෙනත් විෂය සමගාමී කටයුතු සඳහා පාසල ආරම්භයට පෙර හෝ පාසල් කාලයෙන් පසු ව සිසුන් රැදී සිටින්නේ නම් ගුරුවරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ කටයුතු කිරීම.

3.13 පාසල් කාලයට පෙර/පසු ව බාහිර පුද්ගලයන්ට පාසල් පරිශ්‍රයට පිවිසීම සඳහා ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම.

3.14 ක්‍රීඩා පිටි, පාසල් ගොඩනැඟිලි ආදිය බාහිර පාර්ශව සඳහා ලබා දීමේ දී පාසලේ ආරක්ෂාව පිළිබඳව සැළකිලිමත් වීම.

3.15 හදිසි අවස්ථාවල දී තොරතුරු දැනුම් දීමේ දූරකථන අංක හා අනෙකුත් විධි පිළිබඳ ව විධිමත් සන්නිවේදන වැඩපිළිවෙලක් සකස් කර සිසුන් හා දෙමාපියන් දැනුවත් කිරීම.

3.16 පාසලට විවිධ සේවාවන් සපයන පුද්ගලයන්ගේ වාහන, පාසල් කාර්ය මණ්ඩලවල වාහන නිසි පරීක්ෂාවකින් යුතු ව පාසල් පරිශ්‍රයට ඇතුළත් කරගැනීම.

3.17 පාසල් පරිශ්‍රය ශුද්ධ පවිත්‍ර කිරීමට කටයුතු කළ යුතු අතර භාවිතා නොවන ලී බඩු උපකරණ, අබිලි ද්‍රව්‍ය ආදිය විධිමත් පරිදි ඉවත් කිරීම හෝ සුදුසු පරිදි ස්ථාන ගත කිරීම හා භාවිතා නොකරන ගොඩනැඟිලි පවතී නම් ඒ පිළිබඳ ව සැළකිලිමත් වීම.

3.18 පාසල් පරිශ්‍රය තුළ ආරක්ෂක වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා ශිෂ්‍ය භට බණ්ඩ භාර නිලධාරී හා ශිෂ්‍ය භට බණ්ඩයේ සිසුන්ගේ සහාය ද ලබා ගැනීමට කටයුතු කළ හැකි ය.

පාසලේ සියලු කාර්ය මණ්ඩලය, දෙමාපියන් ආදිශිෂ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු නිලධාරීන් මෙම ආරක්ෂක වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා පූර්ණ වගකීමෙන් යුතු ව කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

01. ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය
02. අග්‍රාමාත්‍ය ලේකම් - අග්‍රාමාත්‍ය කාර්යාලය
03. ආරක්ෂක ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය
04. පොලිස්පති - ප්‍රධාන පොලිස් මූලස්ථානය
05. අධ්‍යක්ෂ - ජාතික ශිෂ්‍ය භට බලකාය

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ඊඩී/1/1/2/1
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2019-12 16

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන්.

**<u>සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2020</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව මගින් පවත්වනු ලබන උක්ත තරගයට අදාළ චක්‍රලේඛය මේ සමග ඔබ වෙත යොමු කරන අතර, එම චක්‍රලේඛයට අනුව කටයුතු කරන ලෙසට පාසල් වල විදුහල්පතිවරුන් සහ අදාළ නිළධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

එන්.එච්.එම්. චිත්‍රානන්ද,
අධ්‍යාපන ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

# සමස්ත ලංකා පාසල් නර්තන තරග චක්‍රලේඛය - 2020

## චක්‍රලේඛ අංකය - (47/2019)

හැඳින්වීම.

අධ්‍යාපන අමාත්‍යංශය මගින් 1970 වර්ෂයේ සිට මේ දක්වා දිවයිනේ සියළුම පාසල්වල නර්තන ගුරු භවතුන්ගේ හා විෂයය හදාරන සිසු දරුවන්ගේ කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහාත්, ඔවුන්ගේ ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය සඳහාත්, මෙම තරගය සංවිධානය කර පවත්වනු ලැබේ. මෙම තරගය මගින් එක් වසරකට සිසුන් 40,000 ක් පමණ තම ප්‍රතිභාව ප්‍රදර්ශනය කරන අතර, අදාල ගුරු භවතුන් තම නිර්මාණ කුසලතා වර්ධනය සඳහා මනා පිටුවහලක්ද ලබා ගනී.

වසරින් වසරට නව ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් පවත්වනු ලබන මෙම තරගය නිසා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථවත් වේ. විෂයය නිර්දේශය අර්ථවත්ව පවත්වාගෙන යාම සඳහා ඉමහත් මෙහෙවරක් කරනු ලබන මෙම තරගය ගුරුභවතුන්ගේ, සිසුන්ගේ සහයෝගය සහ සුහදතාවය සංවර්ධනය කරන තරගයක් බවට ද පත්වී ඇත.

ජය පරාජය සමසේ බෙදා ගැනීමේ උතුම් වූ මානවීය ගුණාංග සංවර්ධනය කරනු ලබන මෙම තරගය විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ළමුන්ගේ ප්‍රායෝගික කුසලතා ප්‍රවර්ධනය කිරීමට ද හේතු වේ.

<u>තරගය පිළිබඳ පොදු නීති රීති.</u>

01. මෙම තරගයට සහභාගීවීම සඳහා, පාසල් පහත ආකාරයට වර්ග කර ඇත.

1. සිසුන් 1000 ට වැඩි පාසල්
2. සිසුන් 301 – 1000 දක්වා පාසල්
3. සිසුන් 300 ට අඩු පාසල් (D)

- ප්‍රාථමික ශ්‍රේණි සඳහා වන තරග (F)
- පුද්ගලික හා ජාත්‍යන්තර පාසල් සඳහා තරග අංග (E) කිහිපයක් ඇතුලත් වේ.
- දමිල මාධ්‍ය පාසල් නර්තන තරග, කර්ණාටක සහ මුස්ලිම් සංගීත තරග හා සමගාමීව පවත්වනු ලැබේ.

**02. සහභාගීත්වය**

ඉහත 1,2,3 වර්ග යටතේ සියළුම රජයේ පාසල් / පිරිවෙන් විද්‍යායතන / අර්ධ රාජ්‍ය පාසල්වලට ඉදිරිපත් විය හැකිය. තරග නිර්මාණය හා පුහුණු කරවීම් අදාල පාසලේ ගුරුභවතුන් විසින්ම සිදුකිරීමට වග බලා ගත යුතු අතර, බාහිර සම්පත්දායකයන් යොදවා ගැනීම සිදු නොකළ යුතුය. මේ සඳහා අවශ්‍යතාව අනුව අදාල අධ්‍යාපන කලාපයේ/ පළාතේ ගුරු උපදේශකවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා ගත හැකිය. නර්තන ගුරුභවතුන් සේවයෙහි යෙදී සිටින පාසල්, ස්වෙච්ඡා ගුරුභවතුන් යොදා නොගත යුතු අතර, එසේ නොවන අවස්ථාවල දී වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ස්වෙච්ඡා ගුරුභවතුන් යොදා ගත හැකිය. (එම පාසලේ වසර දෙකක් සේවය කළ බවට අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර තිබිය යුතුය). ස්ථිර නර්තන ගුරුභවතුන් සේවයෙහි යෙදී සිටින පාසල් මෙම තරගය සඳහා සිසුන් සහභාගී කරවීම අනිවාර්ය වේ. එසේ ඉදිරිපත් නොවන පාසල් පිළිබඳව විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය.

## 03. තරග තෝරා ගැනීම

03.01. සිසුන් 301 -1000 ට අඩු සහ සිසුන් 1000 ට වැඩි පාසල් සඳහා A,B ,C සහ F වශයෙන් කාණ්ඩ 04 කි. මෙම කාණ්ඩ හතරින් තරග අංක 03 කට පමණක් සහභාගී විය හැකිය. (එක් කාණ්ඩයකින් තෝරාගත හැකි වන්නේ එක් තරග අංකයකට පමණි.)

03.02. සිසුන් 1000ට වැඩි පාසල් එක් තරග අංකයක් පමණක් ඉදිරිපත් කරන්නේ නම් එය අනිවාර්යයෙන් සමූහ තරග අංකයක් විය යුතුය. එය A, B කාණ්ඩ දෙකෙන් පමණක් තෝරාගත යුතුය.

03.03. සිසුන් 300 ට අඩු පාසල් D කාණ්ඩයේ ඕනෑම තරග ශීර්ෂ 02ක් ද, 301-1000 අතර C කාණ්ඩයෙන් ඕනෑම එක් ඒකල තරගයක් හෝ ප්‍රාථමික (F) තරගයක වද සහභාගී විය හැක.

03.04. ප්‍රාථමික තරග සඳහා එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ එක් තරග අංකයකට පමණි.

03.05. එක් ජාත්‍යන්තර/පෞද්ගලික පාසලක් සඳහා E කාණ්ඩය යටතේ තරග අංක 02 කට ඉදිරිපත් විය යුතුය.

## 04. තරග අංක සඳහා සහභාගී විය හැකි ගුරු/සිසු සංඛ්‍යාවන් පිළිබඳ උපදෙස්

04.01. ඒකල නර්තන තරග අංක සඳහා, සහාය වාදන සහ ගායනය සමග උපරිම සංඛ්‍යාව 05 කි.

04.02. සියළුම සමූහ නර්තන අංක සඳහා නර්තනයෙන් සහභාගිවිය හැකි උපරිම සංඛ්‍යාව 16 කි. අවම සංඛ්‍යාව 06 කි. සහාය ගායන වාදන සඳහා උපරිම සංඛ්‍යාව 08 කි. මුළු සංඛ්‍යාව උපරිම 24 කි. (මුද්‍රා නාට්‍ය, නාට්‍යමය පෙළපාලි, සමූහ වාදන, චරිත නිරූපණය හැර)

04.03. මුද්‍රා නාට්‍ය සඳහා නර්තන සහ වාදන සමග සහභාගී විය යුතු උපරිම සංඛ්‍යාව 30 කි. නාට්‍යමය පෙළපාලි, සමූහ වාදන සඳහා සහභාගීවිය යුතු උපරිම සංඛ්‍යාව 10 කි.

04.04. ඒකල / යුගල චරිත නිරූපණය සඳහා සහාය වාදනය සමග උපරිම සංඛ්‍යාව 08 කි.

04.05. ඒකල වාදන තරග අංක සඳහා සහාය විය හැක්කේ එක් තාලම්පට වාදකයෙකුට පමණි. හක්ගෙඩිය භාවිතා කරන්නේ නම් තාලම්පට වාදකයා විසින්ම එය සිදු කල යුතුය.

04.06. සහය ගායනය කරමින් තාලම්පට වාදනයේ යෙදෙන විට, එය ගායන සංඛ්‍යාවට අයත් වන අතර, තාලම්පට වාදනය පමණක් සිදුකරන විට වාදන සංඛ්‍යාවට අයත් වේ.

04.07. සිසුන් 300 ට අඩු පාසල් වලින් ඉදිරිපත්වන මිශ්‍ර තරග අංක සඳහා සිසු සිසුවියන් හා සම්බන්ධයෙන් අවම වශයෙන් එක් වර්ගයකින් 3 දෙනෙකුවත් වත් සිටීම අනිවාර්ය වේ.

04.08. සිසුන් 301-1000, සහ 1000ට වැඩි පාසල් තරග අංක සඳහා සහභාගීවීමේ දී, මිශ්‍ර සමූහ වාදන අංක සඳහා වාදනයෙන් ද, මිශ්‍ර සමූහ නර්තන අංක සඳහා නර්තනයෙන් ද, ගැහැණු - පිරිමි සමාන සංඛ්‍යාවන්ගෙන් යුතුව ඉදිරිපත් වීම අනිවාර්ය වේ.

## 05. වාදන සහාය

05.01. ශිෂ්‍ය සංඛ්‍යාව 1000 ට වැඩි පාසල්වලින් ඉදිරිපත් වන සියළුම නර්තන තරග අංක සඳහා සහාය වාදනය සිසුන් විසින්ම ඉදිරිපත් කළ යුතුය. අනෙකුත් පාසල් සඳහා මෙම කොන්දේසිය අදාල නොවන අතර, එම පාසල් හි ගුරුභවතුන්ට ද වාදනයෙන් සහය විය හැකිය.

05.02. ශිෂ්‍ය සංඛ්‍යාව 1000 ට වැඩි පාසල්වලින් ඉදිරිපත් වන පිරිමි නර්තන තරග අංක සඳහා සහාය වාදනයෙන් පිරිමි ළමුන් පමණක් ද, ගැහැණු නර්තන තරග අංක සඳහා සහාය වාදනයෙන් ගැහැණු ළමුන් පමණක් ද, ඉදිරිපත් විය යුතුය. මිශ්‍ර නර්තන තරග අංක සඳහා බෙර වාදනයෙන් සහාය වීමේදී පමණක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙවර්ගයම මිශ්‍ර වශයෙන් සහභාගී විය යුතුය.

05.03. මුද්‍රා නාට්‍ය, නාට්‍යමය පෙළපාලි, ගැමි නැටුම් හා නිර්මාණ නැටුම් සහ චරිත නිරූපණ අංග සඳහා සහාය වාදනයේදී ඉහත 5.2 කොන්දේසි අදාල නොවේ.

## 06. ගායන සහාය

06.01. පිරිමි තරග අංක සඳහා ශිෂ්‍යයන් පමණක් ද, ගැහැණු තරග අංක සඳහා ශිෂ්‍යයාවන් පමණක් ද, මිශ්‍ර තරග අංක සඳහා මිශ්‍ර වශයෙන්ද ගායනයට සහභාගී විය යුතුය.

06.02. ගායනයෙන් සහභාගීවන සියළුම ශිෂ්‍ය ශිෂ්‍යයාවන් ඒ ඒ තරග අංකවලට අදාල ශ්‍රේණි වල විය යුතුය.

06.03. තරග අංක සඳහා ගුරුවරුන්ට ගායනයෙන් සහය විය නොහැකිය.

## 07. තරග අංක සඳහා කාලය

07.01. ඒකල සහ යුගල තරග සඳහා උපරිම කාලය විනාඩි 05 කි.

07.02. සමූහ තරග සඳහා උපරිම කාලය විනාඩි 06 කි.

07.03. මුද්‍රා නාට්‍ය, නාට්‍යමය පෙළපාලි සඳහා උපරිම කාලය විනාඩි 10 කි.

07.04. අමතර සමා කාලය තත්පර 45 කි.

## 08. තරගකරුවන්ගේ ඇඳුම් පැළඳුම්

08.01. කලාප, පළාත් සහ සමස්ත ලංකා අවසන් තරගය සඳහා පුහුණු ඇඳුම් කට්ටලයෙන් පමණක් ඉදිරිපත් විය යුතුය. ශිෂ්‍යාවන්ගේ සාය සහ හැට්ටය තනි වර්ණයෙන් විය යුතු අතර, කළු පිජාමා කලිසම භාවිතා කළ යුතුය. (ලියෝටාඩ් භාවිතා කල නොහැකිය.) ශිෂ්‍යයින් සඳහා කළු පාට අත් රහිත බැනියම (ස්කිනියර්) සහ දණහිස දක්වා උසින් යුක්ත ඉනට අදින කෙටි තනි පාට රෙද්ද සමග කළු පිජාමා කලිසම ද භාවිතා කළ යුතුය. (ඇමුණුම - 01, බලන්න)

08.02. ඇඳුම් අලංකරණය සඳහා රිබන්, රේන්ද, බොත්තම් ආදි අලංකරණ දෑ භාවිත නොකළ යුතුය.

08.03. නර්තනයට විශේෂිත වූ මාල, කරාබු, වළලු ආදී ආභරණ භාවිත කළ නොහැකිය.

08.04. සහය ගායනය / වාදනය සඳහා සහභාගීවන සිසුන් පුහුණු ඇඳුම් කට්ටලයයෙන් සහභාගී විය යුතුය.

08.05. තරගයට ඉදිරිපත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ගුරු භවතුන් පාසලේ අනන්‍යතාවය පෙන්නුම් කෙරෙන ආකාරයේ ඇඳුම් පැළඳුම් හෝ උපකරණ හෝ වෙනත් දෑ භාවිත නොකළ යුතුය.

08.06. කලාප, පළාත් තරග අවස්ථාවන්හි දි ඇඳුම් හා සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වුවහොත් ඒ පිළිබඳව තිරණ ගැනීම, අදල කලාප/පළාත් නර්තන විෂයය භාර නි.අ.අ./ ස.අ.අ. වරුන්ගේ නිර්දේශ මත කලාප / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකල යුතුය.

## 09. වෙනත් උපදෙස්

09.01. යම් තරගකරුවෙකු කලාප තරගය සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණය කළ පසු වෙනත් පාසලකට ඇතුලත් වුවහොත් අදාල වර්ෂයේ පළාත් සහ සමස්ත ලංකා තරග සඳහා ඉදිරිපත් විය යුත්තේ කලාප තරග සඳහා නියෝජනය කළ පාසලෙන් පමණි.

09.02. අ.පො.ස. සාපෙළ / උසස් පෙළ දෙවන වරට පෙනී සිටින සිසුන්ටද සහභාගි විය හැකිය.

09.03. රංග භාණ්ඩ සංඛ්‍යාවන් පිළිබද සීමාවක් නොමැත.

09.04. මුද්‍රා නාට්‍ය හා නාට්‍යමය පෙළපාලි තරග අංග හැර අනෙක් සියළුම නර්තන අංක සඳහා වේදිකා **පසුතල නිර්මාණ භාවිත නොකළ යුතුය.** මුද්‍රා නාට්‍ය හා නාට්‍යමය පෙළපාලි තරග අංක සඳහා සකසනු ලබන පසුතල නිර්මාණ හා සම්බන්ධයෙන් තරග වේදිකාවට ගැලපීමේදී ඇතිවන ගැටළු හෝ අපහසුතා පිළිබද තරග සංවිධායක මණ්ඩලය වගකියනු නොලැබේ. පසුතලය සවි කිරීමට දෙනු ලබන්නේ විනාඩි 05ක කාලයකි.

## 10. ප්‍රාථමික තරග (F කාණ්ඩය)

10.01. එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ එක් තරගයක් සඳහා පමණි. මෙවර තරගයේ දී ප්‍රාථමික පාසල් තරග සඳහා කලාප හා පළාත් යන අවස්ථා දෙකේදී ප්‍රථම/ දෙවන/ තෙවන / ස්ථාන ලෙස තේරීමක් සිදු කළ යුතුය. එහෙත් ජාතික තරග වටයේ දී ඒ ආකාරයෙන් ජයග්‍රහණ ලබා දීම සිදු නොවේ. ඒ සඳහා සම්මානයෙන් සියළුම දරුවන් ඇගයීමට ලක් කෙරේ.

10.02. මිශ්‍ර තරග වලදී ගැහැණු පිරිමි සමාන විය යුතුය.

## 11. තරග පැවැත්වීම.

11.01. කලාප තරග 2020 මාර්තු 30 වන දිනට පෙරද, පළාත් තරග 2020 මැයි 10 වන දිනට පෙරද පවත්වා අවසන් කළ යුතුය. අවසන් තරගය 2020 ජූනි මස 06 සහ 07 දිනයන්හි දී පැවැත්වෙන බැවින්, පළාත් තරග ප්‍රතිඵල ලේඛනය 2020 මැයි 10 වන දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අදාල දිනට පෙර ප්‍රතිඵල එවනු නොලබන පළාත් අවසන් මහා තරගයට සහභාගී නොවන පළාත් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

## 12. අධීක්ෂණය.

12.01. කලාප හෝ පළාත් තරග පැවැත්වීම පිළිබද අධීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියෙකුට හා කලාප තරග පැවැත්වීම පිළිබද අධීක්ෂණය සඳහා අදාල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන ලද නිලධාරියෙකු සහභාගී විය යුතුය.

## 13.විනිශ්චය පිළිගැනීම.

13.01. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
විනිශ්චය මණ්ඩලයේ තීරණයෙන් පසුව විනිශ්චය මණ්ඩලය හෝ සංවිධායක මණ්ඩලය පිළිබඳ පසු විපරම් කිරීම, විවේචනය කිරීම සපුරා තහනම්ය. (වාචිකව, දුරකථන ඇමතුම්, ලිපි මගින්, සමාජ මාධ්‍ය, අන්තර්ජාලය ආදිය)

13.02. මෙම තරගය පිළිබඳව කිසියම් පුද්ගලයෙකුට හානි වන අයුරින් අදහස් ප්‍රකාශ නොකල යුතුය. මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් හා ගුරුභවතුන්ගේ දැඩි අවධානය යොමු විය යුතුය.

13.03. තරග මධ්‍යස්ථාන භූමිය තුළ විනය කඩ කිරීමක් සිදු වුවහොත් අදාල පාසල වෙනුවෙන් විනය ක්‍රියා මාර්ග ගන්නා බව දන්වන අතර, ජයග්‍රහණය ලබා ඇත්නම් එය අවලංගු කිරීමටද හේතුවනු ඇත. ජය පරාජය සමසිතින් විඳ දරා ගැනීමට සිසුන් පුරුදු කළ යුතුය.

13.04. අදාල පාසලේ විදුහල්පති, ගුරු භවතුන්, තරග අංක සඳහා සහභාගී වන අයට පමණක් තරග මධ්‍යස්ථානය වෙත ඇතුල්වීමට අවසර ඇත.

13.05. මෙම චක්‍රලේඛ කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අභියාචනා හෝ විරෝධතා, තරග ප්‍රතිඵල දීමට පෙර ඉදිරිපත් කළ යුතුය. ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව ඉදිරිපත් කරන අභියාචනා අදාල පාසලේ විදුහල්පති, විෂයභාර නිලධාරියා මගින් කලාප / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

13.06. ජාතික මට්ටමේ තරගයේදී විනිශ්චයෙන් පසු ලැබෙන අභියාචනා පිළිබඳ තීරණ තරග සංවිධාන මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

13.07. ජාතික මට්ටමේ තරග සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් සෞන්දර්ය අධ්‍යක්ෂකගේ නිර්දේශ මත පත් කරන ලද කමිටුවක් මගින් ද, පළාත් තරගයකදී පළාත් සෞන්දර්ය නි.අ.අ./ස.අ.අ. ගේ නිර්දේශ මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද , කලාප තරගයක දී කලාප සෞන්දර්ය නි.අ.අ. / ස.අ.අ. ගේ නිර්දේශ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද, අවසාන තීරණය දෙනු ලැබේ.

## 14. අයදුම්පත් යොමු කිරීම.

තරගය සඳහා ඉදිරිපත් වීමේදී අදාල චක්‍රලේඛයේ අංක 02 ඇමුණුම අනුව සකස් කරන ලද අයදුම් පත් භාවිතා කළ යුතුය. සහභාගිවන සෑම ශිෂ්‍යයෙක්ම විදුහල්පති ඉදිරියේ එක් තීරුවක අත්සන් කළ යුතු අතර, අනෙක් තීරුව තරග සංවිධාන මණ්ඩලය ඉදිරියේ අත්සන් කිරීමට ඉඩ තැබිය යුතුය. විදුහල්පති විසින් සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිට පතක්ද , 06 – 09 ශ්‍රේණි සඳහා විදුහල්පති විසින් සහතික කරන ලද ඡායාරූපයක්ද, 10 - 13 වසර දක්වා සිසුන් වලංගු හැඳුනුම්පතක් ද ඉදිරිපත් කළ යුතුය.

15. මෙම තරගාවලියේදී නර්තන විෂයෙහි ගුණාත්මක බව ආරක්ෂා වීම සඳහා සාරධර්ම ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට තම සිසුන් තුළ ආකල්ප සංවර්ධනය කළ යුතුය. (උදා - අනාගයන්ට, වේදිකාවට, වාද්‍ය භාණ්ඩවලට ගරු කිරීම, පාවහන් ගලවා බෙර වාදනය, ආචාර සමාචාර කිරීම, ඉවසීම, ගුරුභවතුන්ගේ හැසිරීම අදහස් හුවමාරුව මාධ්‍ය අදහස් දැක්වීම ආදී ගුණාංග)

සිසුන් 1000 ට අඩු පාසල්

## A කාණ්ඩය

6,7,8,9 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 01 | ගැහැණු | සමූහ | උඩරට | වෛරොඩි වන්නම |
| තරග අංකය | 02 | පිරිමි | සමූහ | උඩරට | නෛඅඩි වන්නම |
| තරග අංකය | 03 | මිශ්‍ර | සමූහ | උඩරට | සැවුලා වන්නම |
| තරග අංකය | 04 | ගැහැණු | සමූහ | පහතරට | ශුද්ධ තාලය සින්දු වන්ම (මාත්‍රා 2+2+4) |
| තරග අංකය | 05 | පිරිමි | සමූහ | පහතරට | කොන්ඩනාලිංචි තාලය සින්දු වන්නම(මාත්‍රා 2+2+4) |
| තරග අංකය | 06 | මිශ්‍ර | සමූහ | පහතරට | ලලිතරාග තාලය සිංදු වන්නම |
| තරග අංකය | 07 | ගැහැණු | සමූහ | සබරගමු | අනිලා වන්නම |
| තරග අංකය | 08 | පිරිමි | සමූහ | සබරගමු | මණ්ඩුක වන්නම |
| තරග අංකය | 09 | මිශ්‍ර | සමූහ | සබරගමු | කොවුලා වන්නම |

6,7,8,9 ශ්‍රේණි සඳහා සමූහ ගැමි නැටුම්

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 10 | ගැහැණු | සමූහ | පන්නෙලීම |
| තරග අංකය | 11 | පිරිමි | සමූහ | කඩු |
| තරග අංකය | 12 | මිශ්‍ර | සමූහ | රබන් (රබන් කරකැවීම යොදාගත නොහැකිය) |

6-13 ශ්‍රේණි සඳහා මුද්‍රා නාට්‍ය
(මෙම තරග අංකය සඳහා රංග වස්ත්‍ර, රංග භාණ්ඩ භාවිතා කල හැක.)

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 13 | ගැහැණු | සමූහ | වෙස්සන්තර |
| තරග අංකය | 14 | පිරිමි | සමූහ | ආලවක දමනය |
| තරග අංකය | 15 | මිශ්‍ර | සමූහ | විජය කුවේණි කථාව |

## B කාණ්ඩය

10,11,12,13 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 16 | ගැහැණු | සමූහ | උඩරට | දුනු මාලප්පුව (අලංකාර මාත්‍රා සහිතව) |
| තරග අංකය | 17 | පිරිමි | සමූහ | උඩරට | යක් ඇන්නුම (තක්කුංදං.... (මහතනිතිත) සිට අවසානය දක්වා) |
| තරග අංකය | 18 | මිශ්‍ර | සමූහ | උඩරට | කොහොඹා හැල්ල (කෙටි කවි, කවි ගායනය සමග ආරම්භයේ සිට අවසානය දක්වා තිත් මාත්‍රා සහිතව) |
| තරග අංකය | 19 | ගැහැණු | සමූහ | පහතරට | ගිරිදේවි |
| තරග අංකය | 20 | පිරිමි | සමූහ | පහතරට | දෙවොල් |
| තරග අංකය | 21 | මිශ්‍ර | සමූහ | පහතරට | ගෙජ්ජි මාත්‍රය |
| තරග අංකය | 22 | ගැහැණු | සමූහ | සබරගමු | යාදිනි මාත්‍රය |
| තරග අංකය | 23 | පිරිමි | සමූහ | සබරගමු | පන්දම් පද (පන්දම් නොදල්වා) |
| තරග අංකය | 24 | මිශ්‍ර | සමූහ | සබරගමු | යහන් දැක්ම |

10,11,12,13 ශ්‍රේණි සඳහා සමූහ නිර්මාණ නර්තන (කවි නිර්මාණය කර ගත යුතුය.)

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 25 | ගැහැණු | සමූහ | දෙමව් පිය ගුණ තේමා කරගත් නිර්මාණාත්මක නර්තනයක්. |
| තරග අංකය | 26 | පිරිමි | සමූහ | ගුරුවරයාගේ ගුණතේමා කරගත් නිර්මාණාත්මක නර්තනයක්. |
| තරග අංකය | 27 | මිශ්‍ර | සමූහ | දෙවියන්ගේ ගුණ වර්ණනා ඇතුළත් පූජා අර්ථය ඉස්මතුවන පරිදි නිර්මාණාත්මක නර්තනයක්. |

6-13 ශ්‍රේණි සඳහා සමූහ වාදන

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 28 | ගැහැණු | සමූහ | ගැට බෙරය ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 29 | පිරිමි | සමූහ | ගැට බෙරය, පහතරට බෙරය, තම්මැට්ම (දවුල බෙරය රහිතව) සමග පහත සඳහන් භාණ්ඩ 02ක් ද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක්.<br>(ඉන්දියානු ඩෝල්, කහෝන්, තවිල්, මද්දල) |
| තරග අංකය | 30 | මිශ්‍ර | සමූහ | ගැට බෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ම, හොරණෑව, දවුල බෙරය ඇසුරින් නිර්මාණාත්මක වාදනයක්. |

- (ඉහත සමූහ වාදන තරග අංගයන් සඳහා භාවිතා කළ යුත්තේ නම් කර ඇති භාණ්ඩ පමණකි.)

6-13 ශ්‍රේණි සඳහා නාට්‍යමය පෙළපාලි

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 31 | ගැහැණු | සමූහ | පහතරට නර්තන සම්ප්‍රදායේ දෙවොල් ගොඩබැසීම. |
| තරග අංකය | 32 | පිරිමි | සමූහ | උඩරට නර්තන සම්ප්‍රදායේ ඌරා යක්කම |
| තරග අංකය | 33 | මිශ්‍ර | සමූහ | සබරගමු නර්තන සම්ප්‍රදායේ - අඹ විදමන |

- (ඉහත නාට්‍යමය පෙළපාලි තරග අංගයන් සඳහා රංග භාණ්ඩ, ඇඳුම් පැළඳුම් වෙස් මුහුණු භාවිතා කළ හැකිය.
- යහන්, මල් පැල්, වීදි භාවිතා නොකළ යුතුය. අඹ විදමන සඳහා සංකේතාත්මක අඹ අත්තක් භාවිතා කළ හැකිය.
- පහන්, පන්දම් ආදී දැල්වෙන දේ භාවිතා නොකළ යුතුය.

## C කාණ්ඩය

6,7,8,9 ශ්‍රේණි සඳහාඒකල තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 34 | ගැහැණු | ඒකල | උඩරට | උදාර වන්නම |
| තරග අංකය | 35 | පිරිමි | ඒකල | උඩරට | හනුමා වන්නම |
| තරග අංකය | 36 | ගැහැණු | ඒකල | පහතරට | හනුමන්තා තාලය සින්දු වන්නම |
| තරග අංකය | 37 | පිරිමි | ඒකල | පහතරට | භාවාදී තාලය සින්දු වන්නම (සැමට භයංකර) |
| තරග අංකය | 38 | ගැහැණු | ඒකල | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 39 | පිරිමි | ඒකල | සබරගමු | පට්ටුතල් මාත්‍රය |

10,11,12.13 ශ්‍රේණි සඳහා ඒකල තරඟ

| | | | | | |
|---|---|---|---|---|---|
| තරඟ අංකය | 40 | ගැහැණු | ඒකල | උඩරට | ආවැන්දුම (ආරම්භයේ සිට දොගරජිං වට්ටම සහිතව) |
| තරඟ අංකය | 41 | පිරිමි | ඒකල | උඩරට | බුලත් පදය |
| තරඟ අංකය | 42 | ගැහැණු | ඒකල | පහතරට | යහන්දැක්ම |
| තරඟ අංකය | 43 | පිරිමි | ඒකල | පහතරට | ලිව්ඡවි |
| තරඟ අංකය | 44 | ගැහැණු | ඒකල | සබරගමු | කෙණ්ඩි පාලිය |
| තරඟ අංකය | 45 | පිරිමි | ඒකල | සබරගමු | දේව කෝල් පාඩුව |

6,7,8,9 ශ්‍රේණි සඳහා ඒකල බෙර වාදනය

| | | | | | |
|---|---|---|---|---|---|
| තරඟ අංකය | 46 | ගැහැණු | ඒකල | උඩරට | මඟුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරඟ අංකය | 47 | පිරිමි | ඒකල | උඩරට | මඟුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරඟ අංකය | 48 | ගැහැණු | ඒකල | පහතරට | මඟුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරඟ අංකය | 49 | පිරිමි | ඒකල | පහතරට | මඟුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරඟ අංකය | 50 | ගැහැණු | ඒකල | සබරගමු | පූජා මංගල දවුල් වාදනය |
| තරඟ අංකය | 51 | පිරිමි | ඒකල | සබරගමු | පූජා මංගල දවුල් වාදනය |

10,11,12.13 ශ්‍රේණි සඳහා ඒකල සහ යුගල බෙර වාදනය

| | | | | | |
|---|---|---|---|---|---|
| තරඟ අංකය | 52 | ගැහැණු | යුගල | උඩරට | අත්‍යාබෙර (තිත් රූප තුනකට) |
| තරඟ අංකය | 53 | පිරිමි | යුගල | උඩරට | අත්‍යාබෙර (තිත් රූප තුනකට) |
| තරඟ අංකය | 54 | ගැහැණු | ඒකල | පහතරට | මඟුල් බෙර වාදනය (දෙක-තුන වට්ටම් ඇසුරින්) |
| තරඟ අංකය | 55 | පිරිමි | ඒකල | පහතරට | මඟුල් බෙර වාදනය (දෙක-තුන වට්ටම් ඇසුරින්) |
| තරඟ අංකය | 56 | ගැහැණු | ඒකල | සබරගමු | දවුල් පද ඇසුරින් ශාස්ත්‍රීය වාදනයක් |
| තරඟ අංකය | 57 | පිරිමි | ඒකල | සබරගමු | හුරු නුහුරු පද ඇසුරින් ශාස්ත්‍රීය වාදනයක් (අත්මාරු, ගුටි මානම්) |

- ඉහත ඒකල සහ යුගල බෙර වාදන අංග සඳහා සහාය වාදනයෙන් සහභාගීවිය හැක්කේ එක් තාලම් පට වාදකයෙකුට පමණි.

10,11,12.13 ශ්‍රේණි සඳහා ඒකල සහ යුගල චරිත නිරූපණ

| | | | | |
|---|---|---|---|---|
| තරඟ අංකය | 58 | ගැහැණු | ඒකල | සීතා දේවිය |
| තරඟ අංකය | 59 | පිරිමි | ඒකල | සීගිරි කශ්‍යප |
| තරඟ අංකය | 60 | මිශ්‍ර | යුගල | නල දමයන්ති |

**සිසුන් 1000 ට වැඩි පාසල්**

## A කාණ්ඩය

6,7,8,9 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 61 | ගැහැණු | සමූහ | උඩරට | වෛරොඩි වන්නම |
| තරග අංකය | 62 | පිරිමි | සමූහ | උඩරට | නෛයඩි වන්නම |
| තරග අංකය | 63 | මිශ්‍ර | සමූහ | උඩරට | සැවුලා වන්නම |
| තරග අංකය | 64 | ගැහැණු | සමූහ | පහතරට | ශුද්ධ තාලය සින්දු වන්ම (මාත්‍රා 2+2+4) |
| තරග අංකය | 65 | පිරිමි | සමූහ | පහතරට | කොන්ඩනාලිංචි තාලය සින්දු වන්නම (මාත්‍රා 2+2+4) |
| තරග අංකය | 66 | මිශ්‍ර | සමූහ | පහතරට | ලලිතරාග තාලය සින්දු වන්නම |
| තරග අංකය | 67 | ගැහැණු | සමූහ | සබරගමු | අනිලා වන්නම |
| තරග අංකය | 68 | පිරිමි | සමූහ | සබරගමු | මණ්ඩුක වන්නම |
| තරග අංකය | 69 | මිශ්‍ර | සමූහ | සබරගමු | කොවුලා වන්නම |

6,7,8,9 ශ්‍රේණි සඳහා සමූහ ගැමි නැටුම්

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 70 | ගැහැණු | සමූහ | පන්නෙලීම |
| තරග අංකය | 71 | පිරිමි | සමූහ | කඩු |
| තරග අංකය | 72 | මිශ්‍ර | සමූහ | රබන්(රබන් කරකැවීම යොදාගත නොහැකිය) |

6- 13ශ්‍රේණි සඳහා මුද්‍රා නාට්‍ය

මෙම තරග අංකය සඳහා රංග වස්ත්‍ර, රංග භාණ්ඩ භාවිතා කල හැක.

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 73 | ගැහැණු | සමූහ | වෙස්සන්තර |
| තරග අංකය | 74 | පිරිමි | සමූහ | ආලවක දමනය |
| තරග අංකය | 75 | මිශ්‍ර | සමූහ | විජය කුවේණි කථාව |

## B කාණ්ඩය

10,11,12,13 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 76 | ගැහැණු | සමූහ | උඩරට | දුනුමාලප්පුව (අලංකාර මාත්‍රා සහිතව) |
| තරග අංකය | 77 | පිරිමි | සමූහ | උඩරට | යක් ඇන්නුම (තක්කුංදං.... (මහතනිතිත) සිට අවසානය දක්වා) |
| තරග අංකය | 78 | මිශ්‍ර | සමූහ | උඩරට | කොහොඹා හැල්ල (කෙටි කවි, කවි ගායනය සමග ආරම්භයේ සිට අවසානය දක්වා තිත් මාත්‍රා සහිතව) |
| තරග අංකය | 79 | ගැහැණු | සමූහ | පහතරට | ගිරිදේවි |
| තරග අංකය | 80 | පිරිමි | සමූහ | පහතරට | දෙවොල් |
| තරග අංකය | 81 | මිශ්‍ර | සමූහ | පහතරට | ගෙජ්ජි මාත්‍රය |
| තරග අංකය | 82 | ගැහැණු | සමූහ | සබරගමු | යාදිනි මාත්‍රය |
| තරග අංකය | 83 | පිරිමි | සමූහ | සබරගමු | පන්දම් පද (පන්දම් නොදල්වා) |
| තරග අංකය | 84 | මිශ්‍ර | සමූහ | සබරගමු | යහන් දැක්ම |

10,11,12,13 ශ්‍රේණි සඳහා සමූහ නිර්මාණ නර්තන (කවි නිර්මාණය කරගත යුතුය.)

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 85 | ගැහැණු | සමූහ | දෙමව් පිය ගුණතේමා කරගත් නිර්මාණාත්මක නර්තනයක්. |
| තරග අංකය | 86 | පිරිමි | සමූහ | ගුරුවරයාගේ ගුණතේමා කරගත් නිර්මාණාත්මක නර්තනයක්. |
| තරග අංකය | 87 | මිශ්‍ර | සමූහ | දෙවියන්ගේ ගුණ වර්ණනා ඇතුළත් පූජා අර්ථය ඉස්මතුවන පරිදි නිර්මාණාත්මක නර්තනයක්. |

6-13 ශ්‍රේණි සඳහා සමූහ වාදන

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 88 | ගැහැණු | සමූහ | ගැට බෙරය ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 89 | පිරිමි | සමූහ | ගැට බෙරය , පහතරට බෙරය, තම්මැට්ම (දවුල බෙරය රහිතව) සමග පහත සඳහන් භාණ්ඩ 02ක් ද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් (ඉන්දියානු ඩෝල්, කහෝන්, තවිල්, මද්දල) |
| තරග අංකය | 90 | මිශ්‍ර | සමූහ | ගැට බෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ම, හොරණෑව, දවුබෙරය ඇසුරින් නිර්මාණාත්මක වාදන යක්. |

- ඉහත සමූහ වාදන තරග අංගයන් සඳහා භාවිතා කළ යුත්තේ නම්කර ඇති භාණ්ඩ පමණකි.

6-13 ශ්‍රේණි සඳහා නාට්‍යමය පෙළපාලි

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 91 | ගැහැණු | සමූහ | පහතරට නර්තන සම්ප්‍රදායේ දෙවොල් ගොඩබැසීම. |
| තරග අංකය | 92 | පිරිමි | සමූහ | උඩරට නර්තන සම්ප්‍රදායේ ඌරා යක්කම |
| තරග අංකය | 93 | මිශ්‍ර | සමූහ | සබරගමු නර්තන සම්ප්‍රදායේ - අඹ විදමන |

- (ඉහත නාට්‍යමය පෙළපාලි තරග අංගයන් සඳහා රංග භාණ්ඩ,ඇඳුම් පැළඳුම්, වෙස්මුහුණු භාවිතා කළ හැකිය.
- යහන්, මල් පැල්, වීදි භාවිතා නොකළ යුතුය.අඹ විදමන සඳහා සංකේතාත්මක අඹ අත්තක් භාවිතා කළ හැකිය.
- පහන්, පන්දම් ආදී දැල්වෙන දේ භාවිතා නොකළ යුතුය

# C කාණ්ඩය

6,7,8,9 ශ්‍රේණි සඳහා ඒකල තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 94 | ගැහැණු | ඒකල | උඩරට | උදාර වන්නම |
| තරග අංකය | 95 | පිරිමි | ඒකල | උඩරට | හනුමා වන්නම |
| තරග අංකය | 96 | ගැහැණු | ඒකල | පහතරට | හනුමන්තා තාලය සින්දු වන්නම |
| තරග අංකය | 97 | පිරිමි | ඒකල | පහතරට | භාවාදී තාලය සිංදු වන්නම (සැමට භයංකර) |
| තරග අංකය | 98 | ගැහැණු | ඒකල | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 99 | පිරිමි | ඒකල | සබරගමු | පට්ටුතල් මාත්‍රය |

10,11,12.13 ශ්‍රේණි සඳහා ඒකල තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 100 | ගැහැණු | ඒකල | උඩරට | ආවැන්දුම (ආරම්භයේ සිට දොගරජිං වට්ටම සහිතව) |
| තරග අංකය | 101 | පිරිමි | ඒකල | උඩරට | බුලත් පදය |
| තරග අංකය | 102 | ගැහැණු | ඒකල | පහතරට | යහන්දැක්ම |
| තරග අංකය | 103 | පිරිමි | ඒකල | පහතරට | ලිව්ඡවි |
| තරග අංකය | 104 | ගැහැණු | ඒකල | සබරගමු | කෙණ්ඩි පාලිය |
| තරග අංකය | 105 | පිරිමි | ඒකල | සබරගමු | දේව කෝල් පාඩුව |

6,7,8,9 ශ්‍රේණි සඳහා ඒකල බෙර වාදනය

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 106 | ගැහැණු | ඒකල | උඩරට | මගුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරග අංකය | 107 | පිරිමි | ඒකල | උඩරට | මගුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරග අංකය | 108 | ගැහැණු | ඒකල | පහතරට | මගුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරග අංකය | 109 | පිරිමි | ඒකල | පහතරට | මගුල් බෙර ආරම්භය සමග පළමු වට්ටම |
| තරග අංකය | 110 | ගැහැණු | ඒකල | සබරගමු | පූජා මංගල දවුල් වාදනය |
| තරග අංකය | 111 | පිරිමි | ඒකල | සබරගමු | පූජා මංගල දවුල් වාදනය |

09,10,11,12.13 ශ්‍රේණි සඳහා ඒකල බෙර වාදනය

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 112 | ගැහැණු | යුගල | උඩරට | අත්‍යාබෙර (තිත් රූප තුනකට) |
| තරග අංකය | 113 | පිරිමි | යුගල | උඩරට | අත්‍යාබෙර (තිත් රූප තුනකට) |
| තරග අංකය | 114 | ගැහැණු | ඒකල | පහතරට | මගුල් බෙර වාදනය (දෙක-තුන වට්ටම් ඇසුරින්) |
| තරග අංකය | 115 | පිරිමි | ඒකල | පහතරට | මගුල් බෙර වාදනය (දෙක-තුන වට්ටම් ඇසුරින්) |
| තරග අංකය | 116 | ගැහැණු | ඒකල | සබරගමු | දවුල් පද ඇසුරින් ශාස්ත්‍රීය වාදනයක් |
| තරග අංකය | 117 | පිරිමි | ඒකල | සබරගමු | හුරු නුහුරු පද ඇසුරින් ශාස්ත්‍රීය වාදනයක් (අත්මාරු, ගුටි මානම්) |

- ඉහත ඒකල බෙර වාදන අංග සඳහා සහාය වාදනයෙන් සහභාගීවිය හැක්කේ එක් තාලම්පට වාදනයකට පමණි

10,11,12,13 ශ්‍රේණි සඳහා ඒකල සහ යුගල චරිත නිරූපණ

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 118 | ගැහැණු | ඒකල | | සීතා දේවිය |
| තරග අංකය | 119 | පිරිමි | ඒකල | | සීගිරි කශ්‍යප |
| තරග අංකය | 120 | මිශ්‍ර | යුගල | | නල දමයන්ති |

## සිසුන් 300 ට අඩු පාසල් සඳහා පමණි. (D )

**(12 සහ 13 ශ්‍රේණි පමණක් පවතින සෞන්දර්ය පාසල් මේ සඳහා ඉල්ලුම් කළ නොහැක.)**

**06 -13 ශ්‍රේණි සඳහා විවෘත සමූහ තරග**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 121 | ගැහැණු | සමූහ | උඩරට | සුරපති වන්නම |
| තරග අංකය | 122 | පිරිමි | සමූහ | උඩරට | මංගලම් (2+2+2+4+4) |
| තරග අංකය | 123 | මිශ්‍ර | සමූහ | උඩරට | මුසලඩි වන්නම |
| තරග අංකය | 124 | ගැහැණු | සමූහ | පහතරට | ගිරිදේවී |
| තරග අංකය | 125 | පිරිමි | සමූහ | පහතරට | දෙවොල් |
| තරග අංකය | 126 | මිශ්‍ර | සමූහ | පහතරට | සරල කවි තාල (2/4 ,3/3) |
| තරග අංකය | 127 | ගැහැණු | සමූහ | සබරගමු | පට්ටුතාල මාත්‍රය |
| තරග අංකය | 128 | පිරිමි | සමූහ | සබරගමු | යක්පද මාත්‍රය |
| තරග අංකය | 129 | මිශ්‍ර | සමූහ | සබරගමු | දළුමුර පාලිය |
| තරග අංකය | 130 | ගැහැණු | සමූහ | ගැමි | කළගෙඩි |
| තරග අංකය | 131 | පිරිමි | සමූහ | නිර්මාණ | අශ්වයාගේ චලන ඇසුරෙන් නර්තන නිර්මාණයක් |
| තරග අංකය | 132 | මිශ්‍ර | සමූහ | නිර්මාණ | අවුරුදු ක්‍රීඩා ඇසුරෙන් නර්තන නිර්මාණයක් |

ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් සඳහා පමණි (E)

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 133 | ගැහැණු | සමූහ | උඩරට -අස්නය |
| තරග අංකය | 134 | පිරිමි | සමූහ | පහතරට -තෙල්මෙ |
| තරග අංකය | 135 | මිශ්‍ර | සමූහ | සබරගමු -යහන් දැක්ම |
| තරග අංකය | 136 | ගැහැණු | සමූහ | චාමර |
| තරග අංකය | 137 | පිරිමි | සමූහ | පන්තේරු |
| තරග අංකය | 138 | මිශ්‍ර | සමූහ | ගොයම් කැපීම |

**ප්‍රාථමික පාසල් සඳහා පමණි (F)**

**එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ එක් තරගයක් පමණි.මෙවර තරගයේදී ප්‍රාථමික පාසල් සඳහා කලාප හා පළාත් යන අවස්ථා දෙකේදීම ප්‍රථම/දෙවන/තෙවන/ ස්ථාන ලෙස තේරීමක් සිදු කළද, ජාතික තරග වටයේදී ඒ ආකාරයෙන් ජයග්‍රහණයක් ලබා දීම සිදු නොවේ. ඒ සඳහා සම්මානයෙන් සියළුම දරුවන් ඇගයීමට ලක් කෙරේ. (තාක්ෂණය පාසල විසින් සපයා ගත යුතුය)**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 139 | ගැහැණු | සමූහ | වෙසක් කැකුළු අතුඅග.... ගීතයකට නර්තනයක් |
| තරග අංකය | 140 | පිරිමි | සමූහ | වලාකුලෙන් බැස සමන් කුලත් වැද..... ගීතයකට නර්තනයක් |
| තරග අංකය | 141 | මිශ්‍ර | සමූහ | ආදේශ භාණ්ඩ ඇසුරින් වැස්ස තේමාකරගත් වාදනයක් |

දෙමළ මාධ්‍ය පාසල් සඳහා තරග (G)

**6,7,8, ශ්‍රේණි සඳහා** සමූහ තරග

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 142 | ගැහැණු | සමූහ | අරිච්චෙට්ටි |
| තරග අංකය | 143 | පිරිමි | සමූහ | කෝල්ලාට්ටම් |
| තරග අංකය | 144 | මිශ්‍ර | සමූහ | පූ පන්දානල් |


**09,10,11,12.13 ශ්‍රේණි සඳහා** සමූහ තරග

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 145 | ගැහැණු | සමූහ | ජතිශ්වරම් |
| තරග අංකය | 146 | පිරිමි | සමූහ | තිල්ලානම් |
| තරග අංකය | 147 | මිශ්‍ර | සමූහ | වර්ණම් |

**මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියළුම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවකම තරග චක්‍ර ලේඛයේ සඳහන් සියළුම නීති රීති පිළි පැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකග විය යුතුය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත්වන පාසල් සඳහා ලබා දෙන තරග කාල සටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් අදාල ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතුය. මෙම තරග චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට පටහැනිව කටයුතු කොට ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවක වුවද ප්‍රතිපල ලේඛන වලින් එම විදුහල ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාල වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.**

**එන්.එච්.එම්. චිත්‍රානන්ද**
**ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය.**

ඇමුණුම - 01



ඇමුණුම 02

# සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2022

01.පාසල අයත් කලාපය -................................................... පළාත -
................................................

02.පාසලේ නම සහ ලිපිනය -........................................................................
........................................................................
........................................................................

03.පාසලේ දුරකථන අංකය -.............................................

| තරඟ ශීර්ෂ අංකය | තරඟයේ නම |
|---|---|
| | |

| අනු අංක | ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම | උපන්දිනය | ඉගෙන ගන්නා ශ්‍රේණිය | විදුහල්පති ඉදිරියේ අත්සන | තරග මණ්ඩලය ඉදිරියේ අත්සන |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |
| 05 | | | | | |
| 06 | | | | | |
| 07 | | | | | |
| 08 | | | | | |
| 09 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |
| 13 | | | | | |
| 14 | | | | | |
| 15 | | | | | |
| 16 | | | | | |

ගායනය සඳහා සහභාගී වන්නන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |

වාදනය සඳහා සහභාගී වන්නන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |

ප්‍රසංග අංග පුහුණු කළ ගුරුභවතුන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |

ඉහත සඳහන් සිසුන් අප විද්‍යාලයේ අදාල ශ්‍රේණි වල ඉගෙන ගන්නා බවත්, අප විද්‍යාලය ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වැඩි/අඩු පාසලක් බවත් ,චක්‍ර ලේඛය අනුව අදාල සිසුන් මා ඉදිරියේ අත්සන් කළ බවත් , චක්‍ර ලේඛයේ සදහන් කරුණු වලට අනුව තරගය සදහා ඉදිරිපත් කිරීම නිර්දේශ කරමි.

විදුහල්පතිගේ අත්සන
නිල මුද්‍රාව

## සමස්ත ලංකා පාසල් නර්තන තරගය 2020 - ඇගයීම් නිර්ණායක

### සාම්ප්‍රදායික - ඒකල තරග (උඩරට /පහතරට /සබරගමු)

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව හා ශාස්ත්‍රීය බව ආරක්ෂා වීම | 30 |
| 02 | වාදන ගායන සුසංයෝගී බව | 30 |
| 03 | රංග වින්‍යාසය, ප්‍රසාංගික බව, සිසු ශක්‍යතා සහ සමස්ත නිමාව | 35 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

### සාම්ප්‍රදායික - සමූහ තරග (උඩරට /පහතරට /සබරගමු)

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව හා ශාස්ත්‍රීය බව ආරක්ෂා වීම | 25 |
| 02 | සාමූහික බව | 15 |
| 03 | වාදන ගායන සුසංයෝගී බව | 20 |
| 04 | රංග වින්‍යාසය, ප්‍රසාංගික බව,සිසු ශක්‍යතා.සමස්ත නිමාව | 35 |
| 05 | රංග වස්ත්‍රාභරණ | 05 |

### නිර්මාණ/ගැමි - සමූහ තරග

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තේමාවට උචිත බව/ නිර්මාණශීලී බව | 25 |
| 02 | සාමූහික බව | 15 |
| 03 | ගායන, වාදන, රංග භාණ්ඩ භාවිතයන්හි උචිත බව හා සුසංයෝගී බව | 20 |
| 04 | රංග වින්‍යාසය, ප්‍රසාංගික බව,සිසු ශක්‍යතා සහ සමස්ත නිමාව | 35 |
| 05 | රංග වස්ත්‍රාභරණ | 05 |

### මුද්‍රා නාට්‍ය

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තේමාවට උචිත බව/ නිර්මාණශීලී බව | 20 |
| 02 | සාමූහික බව | 15 |
| 03 | වාදන, පසුතල ,රංග භාණ්ඩ භාවිතයන්හි උචිත බව හා සුසංයෝගී බව | 20 |
| 04 | රංග වින්‍යාසය, ප්‍රසාංගික බව, සිසු ශක්‍යතා සහ සමස්ත නිමාව | 20 |
| 05 | චරිත නිරූපණය සහ අපූර්වත්වය | 20 |
| 06 | රංග වස්ත්‍රාභරණ | 05 |

නාට්‍යමය පෙළපාලි

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව හා ශාස්ත්‍රීය බව ආරක්ෂා වීම | 25 |
| 02 | වාදන, පසුතල, රංග භාණ්ඩ භාවිතයන්හි උචිත බව හා සුසංයෝගී බව | 20 |
| 03 | රංග වින්‍යාසය, ප්‍රසාංගික බව,සිසු ශක්‍යතා සහ සමස්ත නිමාව | 20 |
| 04 | චරිත නිරූපණය සහ අපූර්වත්වය | 20 |
| 05 | රංග වස්ත්‍රාභරණ | 15 |

ප්‍රාථමික නර්තන

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තේමාවට උචිත බව/ නිර්මාණශීලී බව | 20 |
| 02 | ළමා නර්තනයට උචිත චලන භාවිතය | 20 |
| 03 | සාමූහික බව | 20 |
| 04 | රංග වින්‍යාසය, ප්‍රසාංගික බව, සිසු ශක්‍යතා.සමස්ත නිමාව | 30 |
| 05 | රංග වස්ත්‍රාභරණ | 10 |

ඒකල /යුගල වාදනය

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව හා ශාස්ත්‍රීය බව ආරක්ෂා වීම | 45 |
| 02 | බෙර වාදනයට අදාල වාදන ශිල්ප ක්‍රම,ශක්‍යතා | 50 |
| 03 | රංග වස්ත්‍රාභරණ | 05 |

සමූහ වාදනය

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | ශාස්ත්‍රීය බව /නිර්මාණශීලී බව | 35 |
| 02 | බෙර වාදනයට අදාල වාදන ශිල්ප ක්‍රම,ශක්‍යතා | 35 |
| 03 | වාදනයට අදාල සාමූහික බව | 25 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

චරිත නිරූපණය (ඒකල /යුගල )

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | චරිත නිරූපණය සඳහා චලන යොදා ගැනීම | 30 |
| 02 | සිද්ධි ගොඩනැගීම | 30 |
| 03 | චරිතයට, සිද්ධියට ගැලපෙන භාව ප්‍රකාශය | 30 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 10 |